# පොදුරාජ්‍ය මණ්ඩල නායක සමුළුවෙන් පසු කොළඹ නගරයේ දියුණුව මුළු ලොවටම පෙනේවි

# මිලින්ද මොරගොඩ කියයි

(දුෂාන්ත සමරසේන)

මේ වසරේ ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පොදුරාජ්‍ය මණ්ඩල නායක සමුළුවෙන් පසු කොළඹ නගරයේ දියුණුව මුළු ලෝකයටම පෙනේවි යැයි ජනාධිපති උපදේශක මිලින්ද මොරගොඩ මහතා පැවැසීය.

කොළඹ නගර සභාවේ අලංකාර පවිත්‍රතා සේවා ඇගැයීමේ උත්සවය අමතමින් එසේ පැවැසීය.

නගරයකින් තමයි රටක දියුණුව පෙනෙනන්නේ. අද කොළඹ නගරය ඉතාමත් අලංකාර වෙමින් පවතිනවා. යම් රටක් දියුණු වන්නේ නගරය තුළ තිබෙන විනය අනුවයි ඒ වගේම රටවල ආර්ථික වර්ධනය වෙන්නේ ඒවා පෙනෙනන්නේ නගරයෙන් තමයි.

ලබන අවුරුද්දේ පොදු රාජ්‍ය මණ්ඩලයේ නායක සමුළුව පැවැත්වෙන්නේ ශ්‍රී ලංකාවේ එහිදී කොළඹ අලංකාරය ලෝක නායකයන්ට දැකගත හැකියි. එන වසරේ අපට ජය ගැනීමට අභියෝග රැසක් තියෙනවා. කොළඹ නගරයේ දියුණුව එන්න එන්නම ක්‍රමයෙන් දියුණු වෙනවා. ඒ වගේම තමයි මේ රටත් දියුණු වෙන්නේ. කොළඹ නගර වැසියන් තමයි කොළඹ නගරය පිරිසිදු කරන්නේ. ඒ නිසා ඔවුන් ඇගයීම ඉතා වැදගත් කොට සැලකිය යුතුයි.

කොළඹ නාගරික කොමසාරිස් භද්‍රාණි ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක යන මහත්ම මහත්මීන්ද මෙහිදී කතා කළහ.

මෙම අවස්ථාවට ජනාධිපති උපදේශක ආර්.ඒ.ඩී. සිරිසේන කොළඹ නාගරික මන්ත්‍රී මහින්ද කහඳගම යන මහත්වරුද කොළඹ මහ නගර සභාවේ නිලධාරීහු රැසක්ද සහභාගී වූහ.



කොළඹ නගර සභාවේ අලංකාර හා පවිත්‍රතා සේවකයින් හට ත්‍යාග බෙදා දීම අරලියගහමන්දිරයේ දී සිදුකෙරිණි. එහිදී මිලින්ද මොරගොඩ මහතා සේවකයන්ට ත්‍යාග බෙදා දුන් අයුරු. ජනාධිපති උපදේශක ආර්.ඒ.ඩී. සිරිසේන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක, කොළඹ නාගරික කොමසාරිස් භද්‍රාණි ජයවර්ධන යන මහත්ම මහත්මීහුද මෙහි වෙති.